# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2400/25 - 2024 සැප්තැම්බර් මස 05 වැනි බ්‍රහස්පතින්දා - 2024.09.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනත**

14 වැනි වගන්තිය යටතේ නියමය

ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය රනිල් වික්‍රමසිංහ වන මම, මුදල්, ආර්ථික ස්ථායිකරණ සහ ජාතික ප්‍රතිපත්ති අමාත්‍යවරයාගේ ද එකඟත්වය ඇතිව, 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව, මෙම නියමය මගින් ;

I. මෙහි පහත උපලේඛනයේ II සහ III තීරුවල සංයෝජිත වර්ගීකරණ සංකේතාංක යටතේ දක්වා ඇති අයිතම/භාණ්ඩ ආනයනය කිරීමේ දී, එම අයිතම/භාණ්ඩ මත එකී උපලේඛනයේ IV වැනි තීරුවේ නිශ්චිතව සඳහන්ව ඇති සෙස් බදු අනුප්‍රමාණය, මෙම නියමය මගින් 2024 සැප්තැම්බර් මස 06 වැනි දින සිට ක්‍රියාත්මක වන පරිදි පනවමි.

තවද, 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 14 වැනි වගන්තිය යටතේ පනවනු ලදුව, 2023 ජුනි 16 දිනැති අංක 2336/71 දරන අති විශෙෂ *ගැසට් පත්‍රයේ* පළකරන ලද නියමය, 2024 සැප්තැම්බර් මස 06 දින සිට ක්‍රියාත්මක වන පරිදි මෙමගින් අවලංගු කරමි.


1A - PG 6864 — 429 (2024/09)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

**උපලේඛනය**

| *සං. ශීර්ෂ අංකය (I)* | *සංයෝජිත වර්ගීකරණ සංකේතාංකය (II)* | | *විස්තරය (III)* | *සෙස් බදු ප්‍රමාණය (IV)* |
|---|---|---|---|---|
| | | | | |
| **25.23** | | | **වර්ණ ගැන්වූ හෝ නොගැන්වූ කැට වශයෙන් වූ හෝ එසේ නොවූ පෝට්ලන්ඩ් සිමෙන්ති, ඇලුමිනියම් මිශ්‍රිත සිමෙන්ති (සිමෙන්ති පොණ්ඩු), යබොර සිමෙන්ති, සුපර් සල්ෆේට් සිමෙන්ති සහ එවැනි හයිඩ්‍රොලික් සිමෙන්ති වර්ග** | |
| | | | | |
| | | - | පෝට්ලන්ඩ් සිමෙන්ති : | |
| | 2523.21 | -- | කෘත්‍රිම ලෙස වර්ණ ගැන්වූ හෝ නොගැන්වූ සුදු සිමෙන්ති | කි. ග්‍රෑමයට රු. 4.00 |
| | 2523.29 | -- | අනෙකුත්: | |
| | 2523.29.10 | --- | දිය නාල්ලන සිමෙන්ති, බොයිලර් සිමෙන්ති හා ඒවායේ සංයුතික | කි. ග්‍රෑමයට රු. 4.00 |
| | 2523.29.20 | --- | කි. ග්‍රෑම් 50 සහ ඊට අඩු ඇසුරුම්වලින් ආනයනය කරනු ලබන අනෙකුත් පෝට්ලන්ඩ් සිමෙන්ති | කි. ග්‍රෑමයට රු. 7.00 |
| | 2523.29.30 | --- | කි. ග්‍රෑම් 50 ට වැඩි ඇසුරුම්වලින් හෝ තොග වශයෙන් ආනයනය කරනු ලබන අනෙකුත් පෝට්ලන්ඩ් සිමෙන්ති | කි. ග්‍රෑමයට රු. 4.00 |
| | 2523.90 | - | අනෙකුත් හයිඩ්‍රොලික් සිමෙන්ති | කි. ග්‍රෑමයට රු. 4.00 |

II. "සීමාකාරී තත්ත්වයන්ට යටත්ව කළුගල් අපනයනය තුළින් ශ්‍රී ලංකාවට විදේශ විනිමය ඉපයීම ප්‍රවර්ධනය හා කළුගල් කැනීම්කරුවන් හා ඒ සම්බන්ධ ප්‍රජාවන්හි ජීවන තත්ත්වය ප්‍රවර්ධනය සඳහා ඉඩ ප්‍රස්ථාව සලසා දීම" යන මැයෙන් වූ 2024 මැයි 21 දිනැති සහ 2024 ජුලි 29 දිනැති අමාත්‍ය මණ්ඩල සටහන් සමඟ කියවිය යුතු අමාත්‍ය මණ්ඩල සංදේශ අංක 24/0105/622/002 සඳහා වූ 2024 අගෝස්තු මස 12 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය ප්‍රකාරව, සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 2516.11.00 යටතේ වර්ගීකරණය කළ හැකි කළුගල් කුට්ටි [ඉදිකිරීම් කාර්යයන් සඳහා අපනයනය කරන කළුගල් කුට්ටි (Charnockite and Gneisses)] අපනයනය කිරීමේ දී, පරිසර විෂය භාර අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ නිර්දේශයට යටත්ව 2024 සැප්තැම්බර් 06 සිට ක්‍රියාත්මක වන පරිදි මෙට්‍රික් ටොන් මිලියන එකක් දක්වා ප්‍රමාණයකට කියුබික් මීටර් ($m^3$) එකක් සඳහා රු. 1000/- අනුප්‍රමාණයකින් යුතු සෙස් බද්දක් නියම කොට අයකර ගත යුතුය. සංයෝජිත වර්ගීකරණ සංකේතාංක 2516.11.00 යටතේ වර්ගීකරණය කළ හැකි අනෙකුත් සියලුම කළුගල් අපනයන වලදී, 2021 ජනවාරි 12 දිනැති අංක 2210/09 දරන *ගැසට් පත්‍රයේ* දක්වා ඇති අනුප්‍රමාණවලින් සෙස් බද්දක් නියම කොට අයකර ගත යුතුය.

**රනිල් වික්‍රමසිංහ,**
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍ය.

2024 සැප්තැම්බර් මස 05 වැනි දින,
ආයෝජන ප්‍රවර්ධන අමාත්‍යාංශයේ දී ය.

EOG 09 - 0056

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.